දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**කලා උපාධි පාඨමාලාව 100 මට්ටම විභාගය**

**මාර්ගගත විවෘත ග්‍රන්ථ පාදක විභාගය - 2018 කණ්ඩායම**

**උපදෙස් පත්‍රිකාව**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් කලා උපාධි පාඨමාලාව 100 මට්ටම සඳහා වූ විභාගය (2018 කණ්ඩායම) ජූලි මාසය තුළ (විද්‍යුත් මාර්ගගත නිවාස පාදක විවෘත ග්‍රන්ථ පරීක්ෂණයක් විභාගයක් ලෙස) පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා පහත සඳහන් උපදෙස් තරයේ පිළිපදින්න.

1. ප්‍රශ්නපත්‍ර බාගත කිරීමට (download) හා පිළිතුරුපත් උඩුගත (upload) කිරීමට අදාළ දිනයන් හා වේලාවන් ඇතුළත් විභාග කාල සටහන දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිල වෙබ් අඩවිය හරහා ඔබට විභාගයට පෙර ලබාදෙනු ලැබේ.
2. විභාග කාලසටහන සමඟ විභාග ප්‍රවේශපත්‍රය උඩුගත කරනු ලබන අතර සිසුන් විසින් විභාග ප්‍රවේශ පත්‍රයේ මුද්‍රිත පිටපතක් ලබාගෙන, පිළිතුරු සපයනු ලබන ප්‍රශ්න පත්‍රය ඉදිරියේ අත්සන් යොදා, සම්පූර්ණ විභාගය අවසාන වූ විගස එම විභාග ප්‍රවේශ පත්‍රය CDCE LMS වෙත උඩුගත කළයුතු අතර පසුව එම විභාග ප්‍රවේශ පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් අප වෙත ලැබීමට සැලැස්විය යුතු ය.
3. විභාග ප්‍රශ්නපත්‍ර බාගත කිරීමට (download) හා පිළිතුරුපත් උඩුගත (upload) කිරීමට ලබා දී ඇති වේලාවන් විෂන් අනුව වෙනස් වන බැවින් ඒ පිළිබඳ සිසුන් අවධානය යොමුකල යුතු ය.
4. සිසුන්ට CDCE LMS වෙත ප්‍රවේශවීමට ලබාදී ඇති පරිශීලක නාමය (Username) සහ මුරපදය (Password) භාවිතා කල යුතුය.
5. ප්‍රශ්න පත්‍ර බාගත කිරීමෙන් අනතුරුව සිසුන් විසින් CDCE LMS වෙතින් ඉවත් වීමට (logout) මතක තබාගන්න.
6. විභාගය සඳහා පිළිතුරු සැපයීමට භාවිත කළ **යුත්තේ A4 ප්‍රමාණයේ සුදුපැහැති පත්‍රිකා** (half sheet) **පමණ යි.**
7. සියලු ම පිළිතුරුපත් සුදුසු ස්කෑනරයක් මගින් ස්කෑන් කර එක් පී.ඩී.එෆ් ආකෘතියක් ලෙස(PDF format) සකස් කළ යුතුය. එක් පිළිතුරු පත්‍රයක් දත්ත පරිමාණය 5MB ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.
8. සිසුන් විසින් පිළිතුරුපත් පී.ඩී.එෆ් ආකෘතියට සකස්කිරීමේ දී ස්කෑන් නොකර පිළිතුරුපත්වල ඡායාරූප එකතුකර පී.ඩී.එෆ් ආකෘති සැකසීමෙන් වලකින්න.
9. සිසුන් විසින් පිළිතුරුපත්වල මුල් පිටපත් සුරක්ෂිත ව තබාගත යුතු අතර අප විසින් ඉල්ලුම් කරන ඕනෑම විටක දී ඒවා ඉදිරිපත් කළ යුතු ය.
10. සිසුන් පිළිතුරු පත් උඩුගත කරන විට විෂයට අදාළ පිළිතුරු පත් පහත දක්වා ඇති ආකාරයට නැවත නම් කළ යුතුය. උදා- විෂය කේතය_පරිශීලක නාමය (SOCE101_aeba2018000)
11. පිළිතුරුපත් උඩුගත කරන අවස්ථාවේ දී සිසුන් විසින් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා එක් පිළිතුරුපත්‍ර කට්ටලයක් පමණක් උඩුගත කළ යුතු ය. යම් හෙයකින් ඔබ උඩුගත කළ පිළිතුරුපත නැවත මාරුකිරීමට (Replace) අවශ්‍ය වුවහොත් පෙර උඩුගත කළ පිළිතුරුපත මකා දමා නව පිළිතුරුපත උඩුගත කරන්න. එසේ නැවත මාරුකිරීම (Replace) කළ හැකි වන්නේ ලබා දී ඇති කාලය තුළ පමණි.
12. එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ උපදෙස් එම ප්‍රශ්න පත්‍රයේ දක්වා තිබේ.
13. සිසුන් විසින් පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්න පත්‍රයේ උපදෙස් දී ඇති පිටු ගණන ඉක්මවා පිළිතුරු සැපයීමෙන් වැලකීමට තරයේ මතක තබාගත යුතු ය. එම පිටු ගණන ඉක්මවා පිළිතුරු සපයා ඇති පිටු පිළිතුරු පත් ඇගයීමේ දී සලකා නොබැලේ.
14. ඔබ විසින් පිළිතුරු සපයනු ලබන සියලු ම පිටුවල ඔබගේ ලියාපදිංචි අංකය, විෂය අංකය, මාධ්‍ය සහ පිටු අංකය පිළිවෙළින් පිටුවේ වම්පස ඉහළ කෙළවර සටහන් කිරීම අනිවාර්ය වන අතර සෑම පිටුවකම වම්පස පහළ ඔබේ අත්සන යෙදිය යුතු ය. උදා:

| |
|---|
| **AE/BA/2018/8000**<br>**SOCE101**<br>**SINHALA**<br>**01**<br><br><br>**Signature** |

15. ඔබ පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයියයුතු අතර <u>මුද්‍රිත (Typed) පිළිතුරුපත් කිසිදු අකාරයකින් භාර නොගන්නා බව ද මතක තබාගත යුතු ය.</u>

16. ඔබට ලබා දී ඇති දින හා වේලාවට පෙර උඩුගත කිරීමට නොහැකි වන පිළිතුරු පත් <u>නැවත කිසිදු ආකාරයකින් භාර නොගන්නා</u> බව තරයේ මතක තබාගත යුතු ය.

17. විද්‍යුත් තැපැල මගින් එවනු ලබන පිළිතුරුපත් භාරගනු නොලැබේ.

18. පිළිතුරුපත් උඩුගත කිරීමේ දී ඔබට ලබා දී ඇති වේලාව අවසාන වන තෙක් නොසිට <u>පිළිතුරු ලියූ විගස පිළිතුරුපත් උඩුගත (Upload) කිරීම</u> මගින් විද්‍යුත් මාර්ගගත පද්ධතියේ තදබදය වලක්වා ගත හැකි ය.

19. සිසුන් තම පිළිතුරුපත් අන්තර්ජාල පද්ධතිය වෙත උඩුගත කර සුරැකීම සඳහා (Save), සුරැකීම වෙනස් කරන්න (save changes) යන බොත්තම එබිය (Click) යුතු ය.

20. මෙම විභාගය පැවැත්වෙන ආකාරය, විභාග ප්‍රශ්න පත්‍ර බාගත කරගන්නා ආකාරය, පිළිතුරු පත් උඩුගත කරන ආකාරය ආදී කරුණු ඇතුළත් සිංහල හා දමිළ උපසිරැසි සහිත ව ඉංග්‍රීසි බසින් වීඩියෝ හතරක් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ නිල වෙබ් අඩවිය <u>(https://cdce.pdn.ac.lk/)</u> හරහා ඔබට නැරඹිය හැකිය. <u>විභාගයට පෙර එම වීඩියෝ නැරඹීම අනිවාර්ය වේ.</u>

21. මෙම විභාගය නිවාස පාදක විවෘත ග්‍රන්ථ පරීක්ෂණයක් ලෙස පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර මෙහිදී පිළිතුරු ලිවීමට සිසුන්ට අධ්‍යයන පොත් පත් පරිහරණය කිරීමට නිදහස ඇත. පිළිතුරු ලිවීමේ දී අන්තර්ජාලය හා වෙනත් ප්‍රභවයන්ගෙන් කරනු ලබන උපුටාගැනීම් හෝ වක්‍ර යොමුකිරීම් ආශ්‍රිත ග්‍රන්ථ ලෙස සඳහන් කළ යුතු ය.

22. කිසියම් ආකාරයක විභාග වංචාවකට සම්බන්ධ කවර අයෙකුට හෝ එරෙහි ව දැඩි විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ. වෙනත් සිසුන්ගේ පිළිතුරු පිටපත් කිරීම, පිළිතුරු හුවමාරු කර ගැනීම සහ ව්‍යාජ ලෙස පෙනී සිටීම නොකළ යුතුය.

23. කලා පීඨයේ පීඨාධිපතිතුමාගේ අවසරය පරිදි මාර්ගගත නිවාස පාදක විවෘත ග්‍රන්ථ පරීක්ෂණයන් හි දී සිසුන් විසින් සිදුකරනු ලබන විනය විරෝධි ක්‍රියාවන් සඳහා කලා පීඨය මගින් සම්මත කරගෙන ඇති නියාමනයන්ට අනුකූලව දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමු.

24. මෙම මාර්ගගත විභාගය සඳහා පෙනී සිටීමට නොහැකි සිසුන් හට මීලඟ 100 මට්ටමේ විභාගයට පෙනී සිටිය හැක. එම විභාග වාරය ඔවුන්ගේ <u>ප්‍රථම 100 මට්ටමේ (First attempt) විභාගය</u> ලෙස සැලකේ.

25. නිතර අසන පැන (FAQ) සඳහා පහත සබැඳිය (link) බලන්න.
    <u>https://cdce.pdn.ac.lk/dload/BA_2021/obth/FAQ2.pdf</u>

විභාගය සඳහා ඔබට සුබ පතමු.

වැඩිදුර විස්තර සඳහා පහත විද්‍යුත් ලිපිනය සහ දුරකථන අංක භාවිතා කරන්න.

cdceuopba100level@gmail.com / 0812392208, 0812392215, 0812392218